1. පරිගණකයක් බලගැන්වීමට අදාල ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. පරිගණකයට විදුලිය ලබාදුන් සැනින් ROM මතකයේ ඇති BIOS වැඩසටහන ක්‍රියාත්මක වේ.
B. BIOS වැඩසටහන මඟින් පරිගණකයේ මූලික දෘඪාංග පරීක්ෂා කිරීමක් සිදුකර මෙහෙයුම් පද්ධති මෘදුකාංගයක් ප්‍රධාන මතකයට ඇතුළත් කිරීමට සලස්වනු ලැබේ.
C. BIOS වැඩසටහන පරිශීලකට අවශ්‍ය විටෙක මෙහෙයුම් පද්ධතිය ඔස්සේ ක්‍රියාත්මක කළ හැක.

ඉහත කරුණු අතරින් නිවැරදි වන්නේ,
(1). A හා C පමණි (2). A පමණි (3). B පමණි (4). A හා B පමණි (5). සියල්ලම

2. Boot Strap Loader යනු,
(1). මෙහෙයුම් පද්ධතියක් ප්‍රධාන මතකයට ගෙන ඒමට භාවිතා කරන Programme එකකි.
(2). ප්‍රතිවෛරස් මෘදුකාංගයකි.
(3). BIOS වැඩසටහන වෙනුවට භාවිතා කරයි.
(4). ගොනු කළමනාකරණ වැඩසටහනක් වේ.
(5). පද්ධති මෘදුකාංගයකි.

3. Power On Self Test ක්‍රියාවලිය සිදුවන්නේ,
(1). BIOS වැඩසටහනට ප්‍රථමව ය.
(2). පරිගණකය ක්‍රියා විරහිත කරන අවස්ථාවේදී ය.
(3). වෛරස් වැඩසටහනක් පරිගණකයට ඇතුළත් වන අවස්ථාවේදී ය.
(4). පරිගණකය ක්‍රියාත්මක කළ විගස BIOS මෘදුකාංගය මඟිනි.
(5). ඉහත කිසිවක් නොවේ.

4. පරිගණකයක් බලගැන්වීමේ පිළිවෙල නිවැරදිව දක්වා ඇත්තේ,
(1). පරිගණකය ක්‍රියාත්මක කිරීම (Switch on) - කාල උද්දීපන චීපයට විදුලි (Clock Generator) සංඥාව යොමු වීම - BIOS ක්‍රියාත්මක වීම - CMOS තුළ ඇති තොරතුරු කියවීම - Master Boot Record කියවීම සහ මෙහෙයුම් පද්ධතිය මතකයට ඇතුළත් කිරීම.
(2). පරිගණකය ක්‍රියාත්මක කිරීම - (Switch on) - කාල උද්දීපන චීපයට විදුලි (Clock Generator) සංඥාව යොමු වීම - BIOS ක්‍රියාත්මක වීම - Master Boot Record කියවීම සහ මෙහෙයුම් පද්ධතිය මතකයට ඇතුළත් කිරීම.
(3). පරිගණකය ක්‍රියාත්මක කිරීම - (Switch on) - BIOS ක්‍රියාත්මක වීම - CMOS තුළ ඇති තොරතුරු කියවීම - Master Boot Record කියවීම සහ මෙහෙයුම් පද්ධතිය මතකයට ඇතුළත් කිරීම.
(4). පරිගණකය ක්‍රියාත්මක කිරීම - (Switch on) - කාල උද්දීපන චීපයට විදුලි (Clock Generator) සංඥාව යොමු වීම - CMOS තුළ ඇති තොරතුරු කියවීම - Master Boot Record කියවීම සහ මෙහෙයුම් පද්ධතිය මතකයට ඇතුළත් කිරීම, BIOS ක්‍රියාත්මක වීම
(5). පරිගණකය ක්‍රියාත්මක කිරීම - (Switch on) - BIOS ක්‍රියාත්මක වීම - CMOS තුළ ඇති තොරතුරු කියවීම - කාල උද්දීපන චීපයට විදුලි (Clock Generator) සංඥාව යොමු වීම - Master Boot Record කියවීම සහ මෙහෙයුම් පද්ධතිය මතකයට ඇතුළත් කිරීම.

Scanned with CamScanner

5. Cool Boot යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද ?
(1). පරිගණකයක් විදුලිය විසන්ධි කර පවත්නා අවස්ථාවකදී සාමාන්‍ය ලෙස ක්‍රියාත්මක කිරීම.
(2). වැඩකරමින් සිටින අවස්ථාවක Restart විධානය භාවිතා කර පරිගණකය නැවත මුල සිට ක්‍රියාත්මක කිරීම.
(3). Ctrl + Alt+Del භාවිතා කරමින් පරිගණකය නැවත ක්‍රියාත්මක කිරීම.
(4). පරිගණකය ක්‍රියාත්මක කර Setup වැඩසටහනට යොමු වීම.
(5). ඉහත කිසිවක් නිවැරදි නොවේ.

6. Warm Boot යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද ?
(1). පරිගණකයක් විදුලිය විසන්ධි කර පවත්නා අවස්ථාවකදී සාමාන්‍ය ලෙස ක්‍රියාත්මක කිරීම.
(2). වැඩකරමින් සිටින අවස්ථාවක විදුලිය විසන්ධි කිරීමකින් තොරව Restart කිරීම මඟින් ක්‍රියාත්මක කිරීම.
(3). CD / DVD භාවිතා කරමින් පරිගණකයක් පණ ගැන්වීම.
(4). පරිගණකය ක්‍රියාත්මක කර Setup වැඩසටහනට යොමු වීම.
(5). ඉහත කිසිවක් නිවැරදි නොවේ.

7. Boot Sector පිළිබඳ වැරදි ප්‍රකාශය කුමක් ද ?
(1). Master boot Record Sector ලෙස ද මෙය හඳුන්වයි.
(2). මෙම කැටිත්තේ (Sector) ධාරිතාවය බිටු 512 කි.
(3). මෙම කොටසේ බිටු 446 ක ප්‍රදේශයක Boot Loader වැඩසටහන ගබඩා කර පවතී.
(4). බිටු 66 ක ප්‍රමාණයක් තුළ දෘඪ තැටියේ පාටිෂන් පිළිබඳ තොරතුරු පවතී.
(5). මෙහෙයුම් පද්ධතියට අදාල සියළු තොරතුරු මෙහි පවතී.

8. පහත දක්වා ඇති මෙහෙයුම් පද්ධති අතරින් විවෘත මෘදුකාංගයක් ලෙස හඳුනා ගත හැක්කේ,
(1). Windows XP (2). Linux (3). Windows 95 (4). Windows 8
(5). Apple Macintosh

9. Android මෙහෙයුම් පද්ධති මෘදුකාංගය නිපදවන ලද සමාගම කුමක් ද ?
(1). Microsoft Cooparation (2). Apple Cooparation (3). Google
(4). Adobe Cooparation (5). IBM සමාගම

10. තත්කාලීන මෙහෙයුම් පද්ධති පිළිබඳ නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.
(1). තත්කාලීන මෙහෙයුම් පද්ධතියක ආදානය, ක්‍රියාවලිය, ප්‍රතිදානය යන අවස්ථා එක විටම සිදුවේ.
(2). තත්කාලීන මෙහෙයුම් පද්ධති මාර්ග සංඥා පාලනය සඳහා සුදුසු වේ.
(3). තත්කාලීන මෙහෙයුම් පද්ධති බොහෝ විට උපාංග වලට සෘජුව සම්බන්ධ කර ඇත.
(4). බැංකු ක්ෂේත්‍රයේ භාවිතා වන ATM යන්ත්‍ර තත්කාලීන මෙහෙයුම් පද්ධති ක්‍රියාත්මක වන ස්ථානයකට උදාහරණයකි.
(5). තත්කාලීන මෙහෙයුම් පද්ධතියක ආදානය, ක්‍රියාවලිය, ප්‍රතිදානය එකම අවස්ථාවේ දී සිදු නොවේ.

11. ඉල්ලුම් පිටුවක් (Demand Paging) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?
(1). අතත්‍ය මතකයෙන් ප්‍රධාන මතකයට ක්‍රියායන යොමු කිරීම.
(2). ප්‍රධාන මතකයේ සිට අතත්‍ය මතකයට තොරතුරු ගෙනයාම.
(3). අතත්‍ය මතකය කොටස් වලට බෙදූ විට එක් කොටසක් මේ නමින් හැඳින්වේ.
(4). ප්‍රධාන මතකය මෙහෙයුම් පද්ධතිය මඟින් සමාන කොටස් වලට බෙදූ විට ඒ අතරින් එක් කොටසක් මේ නමින් හැඳින්වේ.
(5). ඉහත කිසිවක් නොවේ.

12. මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයක් නොවන්නේ කුමක් ද ?
(1). ගොනු කළමනාකරණය (2). ක්‍රියාවලි කළමනාකරණය
(3). දෘඪාංග පාලනය (4). මතක කළමනාකරණය
(5). වෛරස් වැනි මෘදුකාංගවලින් ආරක්ෂා කිරීම.

Scanned with CamScanner

13. අත්ල මත තබා භාවිතා කරනු ලබන කුඩා පරිගණක (PDA) තුළ බහුලවම භාවිතා වන මෙහෙයුම් පද්ධති මෘදුකාංග වර්ගය වන්නේ,
(1). තත්කාලීන මෙහෙයුම් පද්ධති
(2). ඒක පරිශීලක ඒක කාර්යය
(3). ඒක පරිශීලක - බහු කාර්යය
(4). බහු පරිශීලක - බහු කාර්යය
(5). ඉහත කිසිවක් නොවේ.

14. පහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගන්න:
A. මෙහෙයුම් පද්ධති මෘදුකාංග මගින් පරිගණකයට සම්බන්ධ දෘඩාංග පාලනය කිරීම සිදු කරනු ලබයි.
B. දෘඩාංග සහ පරිශීලක අතර සම්බන්ධතාවය ගොඩනගනු නොලබයි.
C. මතක කළමනාකරණය, ගොනු කළමනාකරණය මෙහෙයුම් පද්ධති මෘදුකාංගයක කාර්යයන් කිහිපයකි.

ඉහත කරුණු අතරින් මෙහෙයුම් පද්ධතියක් සම්බන්ධව නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1). A හා B පමණි
(2). A පමණි
(3). B පමණි
(4). A හා C පමණි
(5). සියල්ලම

15. ක්‍රියායන සම්බන්ධව පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න:
A. ප්‍රධාන මතකයේ ඉඩ ප්‍රමාණවත් නොවූ අවස්ථාවක සූදානම් තත්ත්වයේ පවත්නා ක්‍රියායනයක් ප්‍රතිහරණය කළ තත්ත්වයට පත් වීමට ඉඩ පවතී.
B. ධාවනය වෙමින් පවත්නා ක්‍රියායනයක් ආදාන හෝ ප්‍රතිදාන (I/O) ඒකකවල බලපෑම නිසා ප්‍රතිහරණය කළ තත්ත්වයට පත්වීමට පුළුවන.
C. ක්‍රියායනයක් සූදානම් තත්ත්වයට පත්ව ධාවන තත්ත්වයේ පවතින විට අවහිර කළ තත්ත්වයට වුවද පත්විය හැක.

ඉහත කරුණු අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1). A හා B පමණි
(2). A පමණි
(3). B පමණි
(4). A හා C පමණි
(5). සියල්ලම

16. දෘඪ තැටියක ගොනු ගබඩා කිරීම සඳහා මෙහෙයුම් පද්ධතියක් අනුගමනය කරන ක්‍රමවේද (Allocating Disk Space) නිවැරදිව ප්‍රකාශ නොවන පිළිතුර කුමක් ද ?
(1). යාබද විභාජනය (Contiguous)
(2). සබැඳි විභාජනය (Linked)
(3). සූචි විභාජනය (Index)
(4). සූචි සහ සබැඳි විභාජනය (Index/Linked)
(5). තැන්පත් වීම (Save)

17. ඒක පරිශීලක ඒක කාර්යය මෙහෙයුම් පද්ධතියක් පිළිබඳව නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.
(1). එක් පරිශීලකයෙකුට එක් කාර්යයක් පමණක් සිදු කිරීමට හැකියාව ඇත.
(2). අත්ල මත තබා ක්‍රියාත්මක කරන කුඩා ප්‍රමාණයේ පරිගණක තුළ බොහෝ විට මෙවැනි මෙහෙයුම් පද්ධති ස්ථාපිත කර ඇත.
(3). මෙවැනි මෙහෙයුම් පද්ධති මෘදුකාංගයක එක් කාර්යයක් පමණක් එක් අවස්ථාවකදී සිදු කළ හැක.
(4). පරිශීලකයින් කිහිප දෙනෙකුට එකවර සම්බන්ධ වීමේ හැකියාවක් නොමැත.
(5). පරිශීලකයින් කිහිප දෙනෙකු එකවර සම්බන්ධ නොවුනත් පරිගණක මෘදුකාංග ගණනාවක් එකවර භාවිතා කිරීමේ හැකියාව පවතී.

18. ප්‍රධාන මතකයට ගෙනවිත් තිබෙන වැඩසටහනක් වෙනත් වැඩසටහනක් සඳහා ප්‍රධාන මතකයේ ඉඩ ලබාදීම සඳහා අතත්‍ය මතකය වෙත ගෙනයාම සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හඳුන්වන්නේ කුමන නමකින් ද ?
(1). ප්‍රතිහරණය (Swapping)
(2). ඉල්ලුම් පිටු සැකසීම (Demand Paging)
(3). පිටුකරණය (Paging)
(4). සන්දර්භ ස්විචය (Context Switching)
(5). අවහිර කළ තත්ත්වය (Block status)

Scanned with CamScanner

19. ක්‍රියායනයක් ධාවන තත්ත්වයට පත් වූ පසු එය ඊළඟට පත්විය හැකි අවස්ථා නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද ?
   (1). ක්‍රියාත්මක වී අවසන් වූ තත්ත්වය, අවහිර කළ තත්ත්වය, ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය, සූදානම් තත්ත්වය, ධාවන තත්ත්වය
   (2). අවහිර කළ තත්ත්වය, ක්‍රියාත්මක වී අවසන් වූ තත්ත්වය, ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය, නිර්මිත තත්ත්වය
   (3). අවහිර කළ තත්ත්වය, ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය, සූදානම් තත්ත්වය, ධාවන තත්ත්වය, නිර්මිත තත්ත්වය
   (4). ක්‍රියාත්මක වී අවසන් වූ තත්ත්වය, අවහිර කළ තත්ත්වය, ධාවන තත්ත්වය, නිර්මිත තත්ත්වය
   (5). ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය, අවහිර කළ තත්ත්වය, ධාවන තත්ත්වය, නිර්මිත තත්ත්වය

20. ක්‍රියායන කළමනාකරණයේ දී භාවිතා වන නියාමකරණ නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
   (1). කළමනාකරණ නියාමකරණය, ක්‍රියායන නියාමකරණය
   (2). දිගුකාලීන නියාමකරණය, කෙටි කාලීන නියාමකරණය, කළමනාකරණ නියාමකරණය
   (3). දිගුකාලීන නියාමකරණය, කෙටි කාලීන නියාමකරණය, මධ්‍ය කාලීන නියාමකරණය
   (4). දිගුකාලීන නියාමකරණය, කෙටිකාලීන නියාමකරණය
   (5). දිගුකාලීන නියාමකරණය, මධ්‍ය කාලීන නියාමකරණය

21. කෙටිකාලීන නියාමකරණය භාවිතා වන්නේ ක්‍රියායන කළමනාකරණයේ කුමන ස්ථානයේ ද ?
   (1). සූදානම් තත්ත්වය සහ අවහිර කළ තත්ත්වය අතර
   (2). සූදානම් තත්ත්වය සහ ධාවන තත්ත්වය අතර
   (3). ධාවන තත්ත්වය සහ අවහිර කළ තත්ත්වය අතර
   (4). අවහිර කළ තත්ත්වය සහ ධාවන තත්ත්වය අතර
   (5). නිර්මිත තත්ත්වය සහ සූදානම් තත්ත්වය අතර

22. ක්‍රියායනයක් සකසනය වෙත යොමු වී ක්‍රියාත්මක වන ආකාරය පාලනය කිරීම සඳහා භාවිතා වන ඇල්ගොරිතමයක් නොවන්නේ කුමක් ද ?
   (1). රවුන්ඩ් රොබින් ක්‍රමවේදය (Round Robin Scheduling)
   (2). පළමු පැමිණීමට පළමු ප්‍රමුඛතාවය (First Come First Served Scheduling)
   (3). කෙටිම කාලය පළමුව ක්‍රියාත්මක කිරීම (Shortest Time First Serve)
   (4). ප්‍රමුඛතා පාදක (Priority Scheduling)
   (5). දිගුකාලීන නියමාකාර (Long term Scheduling)

- 23 සිට 25 දක්වා පහත රූපසටහන උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.




Scanned with CamScanner

23. ක්‍රියායන අවස්ථාවන්ට අදාල රූපසටහනක් ඉහත දක්වා ඇත. එහි A - G දක්වා පිළිවෙලින් ඇතුළත් විය යුතු අවස්ථාවන් නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක් ද ?

(1). A - නිර්මිත තත්ත්වය, B - සූදානම් තත්ත්වය, C - අවහිර කළ තත්ත්වය, D - ධාවන තත්ත්වය, E - අවසන් කළ තත්ත්වය, F - ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය, G - ප්‍රතිහරණය කළ සූදානම් තත්ත්වය

(2). A - ප්‍රතිහරණය කළ සූදානම් තත්ත්වය, B - නිර්මිත තත්ත්වය, C - සූදානම් තත්ත්වය, D - අවහිර කළ තත්ත්වය, E - ධාවන තත්ත්වය, F - අවසන් කළ තත්ත්වය, G - ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය,

(3). A - අවහිර කළ තත්ත්වය, B - නිර්මිත තත්ත්වය, C - සූදානම් තත්ත්වය, D - ධාවන තත්ත්වය, E - අවසන් කළ තත්ත්වය, F - ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය, G - ප්‍රතිහරණය කළ සූදානම් තත්ත්වය

(4). A - ධාවන තත්ත්වය, B - නිර්මිත තත්ත්වය, C - සූදානම් තත්ත්වය, D - අවහිර කළ තත්ත්වය, E - අවසන් කළ තත්ත්වය, F - ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය, G - ප්‍රතිහරණය කළ සූදානම් තත්ත්වය

(5). A - නිර්මිත තත්ත්වය, B - සූදානම් තත්ත්වය, C - ධාවන තත්ත්වය, D - අවහිර කළ තත්ත්වය, E - අවසන් කළ තත්ත්වය, F - ප්‍රතිහරණය කළ සූදානම් තත්ත්වය, G - ප්‍රතිහරණය කළ අවහිර කළ තත්ත්වය

24. ඉහත රූපසටහනේ C සිට D දක්වා කිසියම් ක්‍රියායනයක් ගමන් කිරීමට බලපෑ හැකි වඩාත් නිවැරදි හේතුව පෙන්වා ඇත්තේ කුමන ප්‍රකාශනයේ ද ?

(1). ආදාන උපාංගයන්ගෙන් ඇතිවිය හැකි බලපෑමක් නිසා.

(2). ප්‍රතිදාන උපාංගයන් ඇතිවිය හැකි බලපෑමක් නිසා

(3). ආදාන හෝ ප්‍රතිදාන උපාංගයන්ගෙන් සිදුවිය හැකි බලපෑමක් නිසා.

(4). ක්‍රියායනයක් ක්‍රියාත්මක වී අවසන් වූ විටක

(5). ඉහත කිසිවක් නොවේ.

25. ඉහත රූපසටහනේ B සිට F දක්වා ක්‍රියායනයක් ගමන් කිරීමට අදාලව වන හේතුව නිවැරදිව විස්තර නොවන්නේ කුමන පිළිතුරේද ?

(1). සූදානම් තත්ත්වයේ පවත්නා ක්‍රියායනයක් වෙනත් ක්‍රියායනයක් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට B සිට F දක්වා ගමන් කරනු ලැබේ.

(2). ප්‍රධාන මතකයේ ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී ක්‍රියායන ඉහත අවස්ථා දෙක අතර ගමන් කිරීම සිදුවේ.

(3). X නමැති වැඩසටහන ප්‍රධාන මතකයට යොමුවන විට ප්‍රධාන මතකයේ ඉඩ ප්‍රමාණවත් නොවූ අවස්ථාවකදී මතකයේ මේ වන විට තිබූ Y නමැති වැඩසටහන B සිට F දක්වා ගමන් කරනු ලැබේ.

(4). F වෙත පැමිණ තිබූ ක්‍රියායනයක් නැවතත් B වෙත ගමන් කිරීමට පුළුවන.

(5). F වෙත පැමිණ තිබූ ක්‍රියායනයක් නැවතත් B වෙත ගමන් කිරීමක් සිදුනොවේ.

26. සූදානම් තත්ත්වය සහ ධාවන තත්ත්වය අතර ක්‍රියායන හුවමාරු කිරීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද ?

(1). මධ්‍ය කාලීන නියාමකරණය (2). දිගුකාලීන නියාමකරණය

(3). සන්දර්භ ස්විචය (Context Switch) (4). ක්‍රියායන හුවමාරුව

(5). ක්‍රියායන පාලනය

27. රවුන්ඩ් රොබින් ඇල්ගොරිතමය සම්බන්ධව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. සූදානම් තත්ත්වයේ පවත්නා ක්‍රියායන සකසනය වෙත යොමු කර නිශ්චිත කාල පරාසයක් ක්‍රියාත්මක වීමට ඉඩ ලබාදීම රවුන්ඩ් රොබින් ඇල්ගොරිතමය මගින් සිදුවේ.

B. ධාවනය වෙමින් පවත්නා ක්‍රියායනයකින් කොටසක් ක්‍රියාත්මක වී ඉතිරි කොටස නැවත සූදානම් තත්ත්වයට යොමු වීමට හැකියාව රවුන්ඩ් රොබින් ඇල්ගොරිතමය තුළ පවතී.

C. වර්තමානයේ භාවිතා වන බොහෝ මෙහෙයුම් පද්ධති රවුන්ඩ් රොබින් ක්‍රමවේදයට සකසා ඇත.

ඉහත කරුණු අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1). A හා B පමණි (2). A පමණි (3). B පමණි

(4). A හා C පමණි (5). A,B,C සියල්ලම

Scanned with CamScanner

28. රවුන්ඩ් රොබින් ඇල්ගොරිතමයට අදාලව නිවැරදි නොවන පිළිතුර වන්නේ කුමක් ද ?
(1). ධාවන තත්ත්වයට පත් වූ ක්‍රියායනයක් නැවත සූදානම් තත්ත්වයට පත් වීමක් රවුන්ඩ් රොබින් ඇල්ගොරිතමය තුළ දී සිදුවේ.
(2). ධාවන තත්ත්වයට පත් වූ ක්‍රියායනයක් නැවත සූදානම් තත්ත්වයට පත් වීමක් සිදු නොවේ.
(3). රවුන්ඩ් රොබින් ඇල්ගොරිතමයට අනුව සකසනය සෑම ක්‍රියායනයක් සඳහාම සමාන කාලයක් (Quantum Time) වෙන් කර දෙනු ලැබේ.
(4). බහු කාර්යය මෙහෙයුම් පද්ධතියකට වඩාත් සුදුසු ඇල්ගොරිතමයක් ලෙස රවුන්ඩ් රොබින් ඇල්ගොරිතමය හඳුනා ගත හැක.
(5). රවුන්ඩ් රොබින් ඇල්ගොරිතම ඒක පරිශීලක බහු කාර්යය මෙහෙයුම් පද්ධති සඳහා වඩාත් සුදුසු වේ.

29. FAT 32 ගොනු ව්‍යුහය සම්බන්ධව පහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගන්න.
A. ගොනු නාමය (File Name) තුළ අසීමිත අකුරු ගණනක් අඩංගු කළ හැක.
B. ගොනුවක විශාලත්වය සීමා සහිතය.
C. යුනිකේත සඳහා සහාය නොදක්වයි.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වන්නේ,
(1). A හා B පමණි.
(2). A පමණි.
(3). B හා C පමණි.
(4). C පමණි.
(5). A,B,C සියල්ලම

30. NTFS ගොනු ව්‍යුහය සම්බන්ධව පහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගන්න.
A. ගොනු ආරක්ෂාව ඉහළ මට්ටමක පවතී.
B. විශාල ධාරිතාවයකින් යුත් දෘඪ තැටි සඳහා සහාය දක්වයි.
C. වින්ඩෝස් 95 මෙහෙයුම් පද්ධතිය සඳහා භාවිතා කරන ලදී.

ඉහත ප්‍රකාශ අතරින් NTFS ගොනු ව්‍යුහය සම්බන්ධව නිවැරදි නොවන්නේ කුමක් ද ?
(1). A හා B පමණි.
(2). A පමණි.
(3). A හා C පමණි.
(4). C පමණි.
(5). A B C පමණි.

31. ප්‍රතිහරණ ක්‍රියාවලියේ දී ප්‍රධාන මතකයෙන් ගෙන යන දත්ත ගබඩා කර තබාගනු ලබන්නේ කුමන ස්ථානයේද?
(1). අතත්‍ය මතක ඒකකය (Virtual Memory)
(2). දෘඪ තැටිය (Hard disk)
(3). පඨන මාත්‍ර මතකයේ (ROM)
(4). නිහිත මතකයේ (Cache Memory)
(5). ඉහත කිසිවක් නොවේ.

32. සමන් තම පරිගණකයේ ස්ථාපනය කර ඇති වින්ඩෝස් 7 මෙහෙයුම් පද්ධතිය තුළම, තවත් මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කර, ක්‍රියාත්මක කරමින් සිටී. මෙම ක්‍රමවේදය තාක්ෂණිකව නම් කරනු ලබන්නේ,
(1) අතථ්‍ය පරිගණක (Virtual PC)
(2) මෙහෙයුම් පද්ධති මාරුව (OS Switching)
(3) බහු පරිශීලක (Multi User)
(4) ද්වි පණගැන්වුම් (Dual Boot)
(5) බහු පණගැන්වුම් (Multi Boot)

33. නිමල් ඔහුගේ පරිගණකයේ දෘඪ තැටිය ආකෘතිකරණය (Formatting) කරන ලදී. එහිදී ඔහු විසින් ගොනු ආකෘතිය ලෙස FAT16 ක්‍රමය තෝරා ගන්නා ලදී. ඒ අනුව මෙම දෘඪ තැටිය හා සම්බන්ධව නිවැරදි නොවන කරුණ තෝරන්න.
(1). අදාල දෘඪ තැටියේ තැන්පත් කරන ගොනුවක ගොනු නාමය සීමා වේ.
(2). ගොනුවල සුරක්ෂිත භාවය ඉතා ඉහළ මට්ටමක නොපවතී.
(3). මෙම දෘඪ තැටියේ තැන්පත් කරන ගොනුවක විශාලත්වයේ සීමාවක් පවතී.
(4) ගොනු නාමය අසීමිතව ලබාදීමට පුළුවන.
(5). වඩා කාර්යක්ෂමව දෘඪ තැටියේ ගොනු භාවිතා කිරීමට නොහැක.

Scanned with CamScanner

34. ගොනු පාලන කාණ්ඩයක (File Control Block) පවතින තොරතුරක් සම්බන්ධව වැරදි පිළිතුර තෝරන්න.
(1). ගොනුවේ නම අඩංගුව පවතී.
(2). ගොනුවේ දිගු නාමය අඩංගුව පවතී. (Extension)
(3). ගොනුව ගබඩා කර ඇති ස්ථානය පිළිබඳ තොරතුරු පවතී.
(4) ගොනුවේ වර්ගය (Type of file) අඩංගුව පවතී.
(5). ගොනුවේ නම සහ දිගු නාමයට අදාල තොරතුරු පවතින නමුත් ගොනුව ගබඩා කර ඇති ස්ථානය පිළිබඳ තොරතුරු ගොනු පාලන කාණ්ඩයේ නොපවතී.

35. ගොනු ගබඩා කිරීම සඳහා යාබද විභාජනය (Contiguous) ක්‍රමවේදය භාවිතා කිරීමේ දී ඇතිවන ගැටළුව නිවැරදිව ප්‍රකාශ වන පිළිතුර කුමක් ද ?
(1). නව ගොනුවක් සඳහා ඉඩ ලබාගැනීම කාලයක් ගත වූ විට අපහසු විය හැක.
(2). වැඩි වේලාවක් ගත වීම.
(3). අකාර්යක්ෂමතාවය.
(4). ඇතැම් මෙහෙයුම් පද්ධති ඒ සඳහා සහාය නොදැක්වීම.
(5). වින්ඩෝස් 8 සහිත පරිගණකවල පමණක් මෙම හැකියාව පැවතීම.

36. ප්‍රධාන මතකයේ බාහිර ඛණ්ඩනීකරණයට පිළියමක් වන්නේ,
(1). සුසංහිතකරණය (Compaction)
(2). නිතර දෘඪ තැටිය පරීක්ෂා කිරීම (ScanDisk)
(3). නිර්ඛණ්ඩනීකරණය (Defragment)
(4). ආකෘතිකරණය (Formatting)
(5). ප්‍රධාන මතකයේ ධාරිතාවය වැඩි කිරීම

37. ස්වයංක්‍රීය ගුවන් ගමන් පාලන පද්ධතියක් සඳහා වඩාත්ම සුදුසු මෙහෙයුම් පද්ධති වර්ගය වන්නේ,
(1). තත්‍ය කාල (Real time) වේ.
(2). බහු පරිශීලක බහු-කාර්ය වේ.
(3). තනි පරිශීලක බහු-කාර්ය වේ.
(4). තනි පරිශීලක තනි-කාර්ය වේ.
(5). බහු අනුක්‍රියායන (multi-threading) වේ.

38. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියායනයක් අත්හිටු වීමට සකසනය වෙත ක්ෂණිකව යොමුකරන සංඥාවන් හඳුන්වනු ලබන්නේ,
(1). ප්‍රතිහරණය කිරීම (Swapping)
(2). පිටුකරණය (Paging)
(3). අතුරු බිඳුම (Interrupting)
(4). අවහිර කිරීම (Blocking)
(5). සන්දර්භ ස්විචය (Context Switching)

39. NTFS යන්නෙහි දිගු නාමය වනුයේ,
(1). New Technology File System
(2). Net Tracking File System
(3). Next Technology File System
(4). New Technology Formatting System
(5). New Technology File Software

40. NTFS හා සම්බන්ධ පහත දක්වා ඇති කරුණු අතරින් නිවැරදි නොවන කරුණ කුමක් ද?
(1). ඉතා විශාල ධාරිතාවයකින් යුක්ත ගොනු සැකසීමේ හැකියාව පවතී.
(2). දීර්ඝ ගොනු නාමයක් ලබාදීමේ හැකියාව පවතී.
(3). යුනිකේත (Unicode) සහාය දක්වන ආකාරයේ ගොනු නාම ලබා දීමට පුළුවන.
(4). ගොනු සුරක්ෂිත කිරීමේ හැකියාව ඉහළ මට්ටමක පවතී.
(5). වර්තමානයේ මෙම ආකෘතිකරණය භාවිතා වීමක් සිදු නොවේ.

41. කාල විභාජන මෙහෙයුම් පද්ධති තුළ සූදානම් තත්ත්වයේ පවත්නා ක්‍රියායනයක් ධාවන තත්ත්වයට පත් කරලීමට වඩාත් සුදුසුම ඇල්ගොරිතමය වන්නේ කුමක් ද ?
(1). Round Robin
(2). First Come First Serve
(3). Shortest Job First
(4). Priority base
(5). ඉහත කිසිවක් නොවේ.

Scanned with CamScanner

42. ප්‍රධාන මතකය සහ අතත්‍ය මතකය අතර හුවමාරු වන ක්‍රියායන පිළිබඳ තොරතුරු පවත්වාගෙන යනු ලබන ඒකකය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද ?
(1). Page Table (2). MMU (3). Page Size (4). Page Offset (5). Frame

43. පහත ප්‍රකාශයන් සැලකිල්ලට ගන්න.
A. පරිගණක මතකය කළමනාකරණය කිරීම මෙහෙයුම් පද්ධතියේ කාර්යයක් වේ.
B. පරිගණකයට ඇතුළත් වන වෛරස් මෘදුකාංග විනාශ කිරීමේ හැකියාව මෙහෙයුම් පද්ධතියකට පවතී.
C. මෙහෙයුම් පද්ධති මෘදුකාංගයක් මගින් ගොනු කළමනාකරණය කිරීම සිදු කරයි.

ඉහත ප්‍රකාශ අතරින් මෙහෙයුම් පද්ධතියක් සම්බන්ධව වඩාත් නිවැරදි වන්නේ,
(1). A පමණි. (2). B පමණි (3). C පමණි
(4). A හා C පමණි. (5). A හා B පමණි

44. මෙහෙයුම් පද්ධති ප්‍රධාන වශයෙන් අතුරු මුහුණත් මත වර්ග දෙකකට වෙන් කරනු ලැබේ. එම අතුරු මුහුණත් වනුයේ,
(1). විධාන රේඛා අතුරු මුහුණත් සහ රූපක පරිශීලක අතුරු මුහුණත් (Command line / Graphical User Interface)
(2). විධාන රේඛා අතුරු මුහුණත් සහ භාවිතා කිරීම පහසු අතුරු මුහුණත්
(3). මාර්ගගත සහ මාර්ගගත නොවන
(4). රූපක පරිශීලක අතුරු මුහුණත් සහ මාර්ගගත නොවන අතුරු මුහුණත්
(5). මාර්ගගත සහ විධාන තීරු අතුරු මුහුණත්

45. මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනා ගැනීමට නොහැකි ප්‍රකාශය කුමක් ද ?
(1). මතක කළමනාකරණය මෙහෙයුම් පද්ධතියක එක් කාර්යයකි.
(2). ගොනු කළමනාකරණය මෙහෙයුම් පද්ධතියක කාර්යයකි.
(3). ක්‍රියාවලි කළමනාකරණය මෙහෙයුම් පද්ධතියක කාර්යයකි.
(4). උපාංග කළමනාකරණය මෙහෙයුම් පද්ධතියක කාර්යයකි.
(5). පරිගණකයට ඇතුළත්ව ඇති වෛරස් අනාවරණය කිරීම මෙහෙයුම් පද්ධතියක කාර්යයකි.

46. ප්‍රධාන මතකයේ පවත්නා ක්‍රියායනයක් අතත්‍ය මතකය වෙත ගෙනයාම හඳුන්වනු ලබන්නේ,
(1). සන්දර්භ ස්විචය (Context Switching) (2). ඉල්ලුම් පිටු සෑදීම (Demand Paging)
(3). නියාමකරණය (Scheduling) (4). ප්‍රතිහරණය (Swapping)
(5). අතුරු බිඳුම (Interrupting)

47. බහු කාර්යය මෙහෙයුම් පද්ධතියක් සම්බන්ධව පහත ප්‍රකාශයන් සැලකිල්ලට ගන්න:
A. පරිගණක වැඩසටහන් එකකට වැඩි ප්‍රමාණයක් මතකයේ තබාගෙන කාල පරාසයක් අනුව සකසනයට යොමු කරමින් ක්‍රියාත්මක කරනු ලැබේ.
B. ප්‍රධාන මතකය තුළ වැඩසටහන් කිහිපයක් එක් අවස්ථාවක පවතී.
C. දෘඪ තැටියේ වැඩසටහන් ගණනාවක් තබාගත හැකි නමුත් මතකය තුළට යොමු කළ හැක්කේ එක් වැඩසටහනකි.

ඉහත ප්‍රකාශ අතරින් මෙහෙයුම් පද්ධතියක් සම්බන්ධව වඩාත් නිවැරදි වන්නේ,
(1). A පමණි. (2). B පමණි (3). C පමණි
(4). A හා C පමණි. (5). A හා B පමණි

48. පහත දක්වා ඇති මෙහෙයුම් පද්ධති අතරින් ගුවන් යානා ආරක්ෂක පද්ධතියක් සඳහා වඩාත් සුදුසු වන්නේ,
(1). තත්‍ය කාල පද්ධති (2). ඒක පරිශීලක ඒක කාර්යය පද්ධති
(3). බහු පරිශීලක බහු කාර්යය පද්ධති (4). ඒක පරිශීලක බහු කාර්යය පද්ධති
(5). තත්‍ය කාල ඒක පරිශීලක පද්ධති

Scanned with CamScanner

49. කාල පංගුව (Time Quantum) අර්ථ දක්වා ඇත්තේ පහත දක්වා අතරින් කුමන ඇල්ගොරිතමයේ ද ?
(1). කෙටිම කාර්යය පළමුව (Shortest time First)
(2). ප්‍රමුඛතා පාදක (Priority Base First)
(3). රවුන්ඩ් රොබින් (Round Robin)
(4). විවිධ මට්ටම් පෙළ ගැසුම් (Multilevel Queue Scheduling)
(5). පළමු පැමිණීම පළමුව (First Come First Serve)

50. සන්දර්භ ස්විචය (Context Switching) නමැති ක්‍රියාවලිය සිදුවන්නේ,
(1). සූදානම් තත්ත්වය සහ ධාවන තත්ත්වය අතරය.
(2). ධාවන තත්ත්වය සහ අවහිර කළ තත්ත්වය අතරය.
(3). ධාවන තත්ත්වය සහ අවසන් කළ තත්ත්වය අතරය.
(4). සූදානම් තත්ත්වය සහ අතථ්‍ය මතකය අතරය.
(5). අතථ්‍ය මතකය සහ අවහිර කළ තත්ත්වය අතරය.

51. උපකාරක මෘදුකාංගවලට අයත් නොවන්නේ,
(1). ප්‍රතිවෛරස් මෘදුකාංග (Anti Virus Software)
(2). ආකෘතිකරණ මෘදුකාංග
(3). Scan Disk Software
(4). Microsoft Office
(5). Disk Defragment Software

52. පහත ප්‍රකාශයන් සැලකිල්ලට ගන්න:
A. මෙහෙයුම් පද්ධති මෘදුකාංග (Operating System), උපකාරක මෘදුකාංග (Utility Software) පද්ධති මෘදුකාංග වලට අයත් වේ.
B. ඇසෙම්බ්ලර් (Assembler), සම්පාදක (Compiler), අර්ථ වින්‍යාසක (interpreter) පරිවර්තක වැඩසටහන් ලෙස දැක්විය නොහැක.
C. RAM මතකය හසුරුවනු ලබන්නේ මෙහෙයුම් පද්ධති මෘදුකාංගය මඟිනි.

ඉහත ප්‍රකාශ අතරින් මෙහෙයුම් පද්ධතියක් සම්බන්ධව වඩාත් නිවැරදි වන්නේ,
(1). A හා B පමණි
(2). A පමණි.
(3). B පමණි
(4). C පමණි
(5). සියල්ලම නිවැරදිය.

53. පරිගණකයේ ප්‍රාථමික මතකයේ පවත්නා ඉඩ ප්‍රමාණයට වඩා වැඩ ධාරිතාවයක් සහිත යෙදුමක් ක්‍රියාත්මක කිරීමට යාමේ දී අවශ්‍ය වන අමතර ඉඩ ප්‍රමාණය මෙහෙයුම් පද්ධතිය විසින් සකසා ගැනීමක් සිදුවේ. මේ සඳහා දායක කරගනු ලබන්නේ,
(1). ප්‍රධාන මතකය
(2). අතථ්‍ය මතකය
(3). රෙජිස්තර මතකය
(4). පඨන මාත්‍ර මතකය
(5). නිහිත මතකය

54. දැනට ක්‍රියාත්මක වන ක්‍රියායනයක් නවත්වා මතකය තුළ ඇති වෙනත් ක්‍රියායනයක් ධාවන තත්ත්වයට පත් කරලීම හඳුන්වනු ලබන්නේ ,
(1). සන්දර්භ ස්විචනය
(2). පිටුකරණය
(3). බාහිර ඛණ්ඩනීකරණය
(4). අවහිර කිරීම
(5). අවසන් කළ තත්ත්වයට පත්කරලීම

55. සරල කාණ්ඩ සැකසුම් මෙහෙයුම් පද්ධතියක ලක්ෂණයක් නොවන්නේ කුමක් ද ?
(1). ක්‍රියාත්මක කළ යුතු යෙදුම් විශේෂ උපකරණයක් උපයෝගී කරගෙන චුම්බකිත පටියකට ඇතුළත් කිරීම.
(2). එක් අවස්ථාවක එක් යෙදුමක් බැගින් ක්‍රියාත්මක කිරීම.
(3). මතකයට ඇතුළත් කරන ලද යෙදුම අවසන් වන තෙක් දිගටම ක්‍රියාත්මක කිරීම.
(4). ප්‍රතිදානයන් මුද්‍රණ යන්ත්‍රයකට හෝ වෙනත් චුම්බකිත පටියකට ඇතුළත් කිරීම.
(5). ප්‍රධාන මතකයේ ක්‍රමලේඛන කිහිපයක් තබාගෙන කාල විභාජනය මත සකසනයට ඇතුළත් කිරීම.

Scanned with CamScanner